# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1742/27 - 2012 ජනවාරි 27 වැනි සිකුරාදා - 2012.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

විධාන අංක 40.

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පහත සඳහන් කර ඇති ගෘහස්ත පරිහරණය සඳහා භාවිතා කරනු ලබන ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (Liquefied Petroleum Gas) (LPG) අඩංගු වානේ සිලින්ඩර සහ ඊට අදාළ උපාංග ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද පහත දක්වා ඇති ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වන්නේ නම් මිස කිසිම ආනයනකරුවකු, නිෂ්පාදකයකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් ආනයනය කිරීම, නිපදවීම, බෙදාහැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

| | |
|---|---|
| 1. ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු සඳහා සොඬනල සහ සොඬනල එකලසයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර | SLS 1172 |
| 2. ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු සඳහා 0.5l සිට 150l දක්වා ජල ධාරිතාවයෙන් යුත් ප්‍රවාහනය කළ හැකි වෙල්ඩ් වානේ වායු බහාලු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර | SLS 1178 |
| 3. ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු සිලින්ඩර සමග භාවිතයට ගන්නා කපාට සවිකුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර | SLS 1184 |
| 4. ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු සඳහා යාමකයන් සහ ස්වයංක්‍රීය මාරු උපක්‍රමිකයන් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර | SLS 1180 |
| 5. ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු සඳහා වූ ප්‍රවාහනය කළ හැකි, නැවත පිරවිය හැකි පිත්තල මූට්ටු වානේ බහාලූ සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර | SLS 1303 |

මෙම විධානය වර්ෂ 2012 මාර්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

මේ සම්බන්ධයෙන් 2009 සැප්තැම්බර් මස 30 දින අංක 1621/19 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද විධාන අංක 30 මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2012 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

02 - 391/1

1A - G 15604 — 485 (2012/01)